

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 වප් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 ඔක්තෝම්බර් මස 08 වන ද** | **06 වන කලබ** |

# අහිංසක සතුට

තුරු ලිය වැල් එකට වෙළී
අතු අග නෙක මලින් දිලී
සිනා සලා සුවඳ සලා
ලොව සනසනවා

ළමා ලොවේ පිපෙන කැකුළු
විදූ ලොවට සිනා මුකුළු
සමඟි දමින් එකට බැඳී
ලොව සරසනවා

ළමා - තරුණ - මහලු සැවොම
හැඩ වැඩ කොට මෙත් මල් දම
හැම සතුනට කරුණාවෙන්
සතුට බෙදනවා

(මේ මස 1 ද යෙදුණු ලෝක ළමා දිනය සහ 4 වන ද යෙදුණු ලෝක අහිංසා දිනය නිමිත්තෙනි.)

**- අනඳ**

අවසාන කොටස

# වර්තමාන ලෝකයට බුදු දහම පහදා දෙන්නකු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි
(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි)

ලංකාවේ බෞද්ධයන්ට දීර්ඝ වූ නොබිඳුණු වූ ද ආගමික ඉතිහාසයක් ගැන උදම් ඇනිය හැකි ය. වාර්තා අනුව, අපේ මුතුන් මිත්තන් ඉන්දියාවේ සිට ලංකාවට ආවේ මීට අවුරුදු 2470 කට ඉහත දී ය. පාලි ගාථාවලින් ලියන ලද අපගේ වීර කාව්‍ය වන "මහා වංශයෙහි" අපේ පැරණි වංශ කථා ගැන සඳහන් වෙයි. මෙය සියලු ම ආසියාතික ඉතිහාසවලට වඩා ප්‍රාමාණික යැ යි පෙර දිග පඬිවරු සලකති.

අපගේ ඉතිහාසය ඇත්ත වශයෙන් ආරම්භ වනුයේ මීට අවුරුදු දෙ දහස් දෙ සියයකට පෙර සිංහල ජනතාව බෞද්ධාගම වැලඳ ගැනීමත් සමඟ ය. මහා වංශයට අනුව, ඉන්දියානු අධිරාජයා වූ අශෝක, ලංකාවෙහි බුද්ධාගම පැතිරවීම සඳහා තම පුත් මහින්ද කුමරු ලංකාවට එවී ය. ඒ මිහිඳු මහ රහතන් වහන්සේ සිංහල රජු වූ තිස්ස විසින් සාදරයෙන් පිළිගනු ලැබූ සේක. අනතුරු ව තිස්ස රජතුමා ශ්‍රද්ධාවත් බෞද්ධයෙක් වී ය. රජතුමා බුද්ධාගම වැලඳ ගැනීමෙන් පසු ව, එ තුමා ගේ ඇතැම් ඥාති

කාන්තාවන්ට බෞද්ධ මෙහෙණියන් වීමට වුවමනා වූයේ ය. එ විට මිහිඳු මහ රහතන් වහන්සේ මෙහෙණියක වූ තම සොහොයුරියට - සංඝමිත්තාවන්ට එන්නට යැ යි පණිවිඩ යැවූ සේක. සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ලංකාවට පැමිණෙන විට බුද්ධගයාවේ මහා බෝධි වෘක්ෂයෙන් ශාඛාවක් ද ගෙන ආවා ය. එය තිස්ස රජතුමා විසින් මහත් හරසරින් පිළිගනු ලැබ, ඔහු විසින් ම අනුරාධ පුරයෙහි රෝපණය කරන ලදී. අද වන තුරු ගරු කටයුතු ශාඛා මුල් ආවරණයෙන් පිටතට විහිදුවමින් පවත්නා වූ ඒ බෝධි වෘක්ෂය, ලෝකයේ පුරාණතම ඓතිහාසික වෘක්ෂය වෙයි.

සිංහලයන් ගේ ශිෂ්ටාචාරය ආරම්භ වනුයේ බුද්ධාගමේ පැමිණීමත් සමඟ ය. වාස්තු විද්‍යාව, චිත්‍ර කලාව, මූර්ති කලාව හා වෙනත් උසස් සියලු ම විද්‍යා ලංකාවට ගෙනෙන ලද්දේ මහින්ද මහ රහතන් වහන්සේ ගේ දූත ගමන සමඟ මෙහි පැමිණි බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසිනි. තිස්ස රජතුමා ද ඔහුට පසු ව පැමිණි රජවරු ද බුද්ධ ප්‍රතිමා වහන්සේලා සහිත මහා විහාර සර්වඥ ධාතූන් නිදන් කිරීම සඳහා ඝණ්ටාකාර ගඩොළු ගොඩ නැඟිලි විශේෂයක් වූ දගැප් ද ඉදි කළහ. දුටු ගැමුණු රජතුමා විසින් අනුරාධ පුරයේ ඉදි කරන ලද සුප්‍රසිද්ධ ලෝවා මහා පායෙහි භික්ෂූන් වහන්සේලා උදෙසා ආගාර දහසක් ද ධර්ම දේශනා සඳහා ශාලා ද තිබිණ. සිංහල බුද්ධාගමේ ආදි යුගයේ දී පරහිත කාමිත්වය ම ප්‍රමුඛ ලක්ෂණය වී ය. ආරෝග්‍ය ශාලා ඉදි කරන ලද අතර, දිළින්දන්ට දන් දෙන ලද්දේ ය. "සෑම තැනක ම සුදුසු එළවළු වර්ග ද අල වර්ග ද පලතුරු ගස් ද වැවිය යුතු ය. මාර්ගවල ළිං සෑරවිය යුතු ය. මිනිසුන් ගේත් සතුන් ගේත් ප්‍රයෝජනය සඳහා ගස්

සිටුවිය යුතු ය," යනුවෙන් නියම කළ අශෝක ස්තම්භ අනුව, අතිථීන් සඳහා නිවාස පිහිටුවීම ද සංචාරකයන්ට නොමිලයේ පාවිච්චි කිරීම සඳහා දිවයින පුරා ම පලතුරු ගස් හා එළවළු ගස් වැවීම ද කරන ලදී. කෘෂි කර්මයට දැඩි ඕනෑ කමක් දක්වීමත් කුඹුරු ගොවිතැන් සඳහා ඇල වේලි හා ජලාශ තැනීමත් බුද්ධාගමෙන් කෙළින් ම ලද ප්‍රතිඵල ය. බෞද්ධ විහාරාරාමවල ද උත්සව සඳහා ද මල් බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා ලදී. එ හෙයින් ම උද්‍යාන විද්‍යාව වර්ධනය වී ය. අනුරාධපුරය වටා සැතපුම් ගණන් දිග මල් වතු තිබිණ. අමතෙස්ත ගිරි ශිඛරවලින් ද සැලෙන පොල් අරම්වලින් ද වට වූ ලංකාව, ඇත්ත වශයෙන් එක ම මහා උද්‍යානයක් වූයේ ය.

එහෙත් කුරුඳු සොයා ගෙන පැමිණි යුරෝපීයයන් ගේ ආගමනයෙන් පසු සිංහලයන් ගේ ශිෂ්ටාචාරය පිරිහී ගියේ ය. මුලින් ම පැමිණියෝ 1505 දී පෘතුගීසීහු ය. ඔවුහු 1517 දී ආපසු ආ හ. වෙළෙඳ කටයුතු සඳහා යැ යි කියමින් ඔවුන් ඉදි කරන්නට ආ පැක්ටේරිය, කාල තුවක්කු සවි කරන ලද, සත් සියයක් සොල්දාදුවන් විසින් පාලනය කරන ලද, කොටුවක් බවට පත් වීය. ලංකාව පිළිබඳ බ්‍රිතාන්‍ය විශාරදයකු වන ශ්‍රීමත් ජේම්ස් එමර්සන් ටෙනන්ට් සත්‍ය වශයෙන් ම මෙ සේ කියයි : "යුරෝපීයයන් විසින් යටත් විජිත පිහිටුවීම පිළිබඳ කථාවේ, පෘතුගීසීන් ලංකාවේ දී කළ දේවල් පිළිබඳ වාර්තාවන්ට වඩා අඳුරු සහගත වූ ද පිළිකුල් සහගත වූ ද තවත් පිටුවක් නම් නැත්තේ ම ය." පෘතුගීසිහු සාහසිකයෝ වූහ. ; නීති විරෝධී ලෙස සටන් කරන්නෝ වූහ. ; මුහුදු කොල්ල කරුවෝ වූහ. ඔවුන්ගේ එක ම අදහස වූයේ කොල්ල කෑමත් ගින්නේ හා කඩුවේ

බලයෙන් සිංහලයන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමත් ය. ඔවුන් ගේ ඉතා ම ම්ලේච්ඡ ආගමික වධ හිංසා නිසා, ජනතාව ද ඔවුන් ගේ පිරිසිදු බුද්ධාගම ද පිරිහී ගියේ ය.

ඊට ශත වර්ෂයකට පසු ව ලන්දේසීන් විසින් මේ ආගමික වධ හිංසාවලින් සිංහලයා ගලවා ගැනීමට පොරොන්දු වූ විට, ස්වාභාවික ව ම මහනුවර සිංහල රජතුමා ඔවුන් දෑතින් ම පිළිගත්තේ ය. එහෙත් 1658 වන තුරු පෘතුගීසීන් දිවයිනෙන් මුළු මනින් ම පලවා හැරීමට නොහැකි වී ය. ඇත්ත වශයෙන් ම ලන්දේසීන් සිංහලයන් වෙනුවෙන් අවි අතට ගෙන තිබුණේ හුදු පරහිත කාමිත්වයෙන් ම නො වේ. ඔවුහු කුරුඳුවලට හා කුළු බඩුවලට ද පුවක්වලට හා දැව වර්ගවලට ද ඇතුන්ට හා මුතුවලට ද කෑදර වූහ. ලන්දේසි යටත් විජිත පිළිබඳ භාණ්ඩාගාරය පුරවනු සඳහා ලුණු, මාළු, ඉඩම් හා වෙනත් රජයේ වෙළෙඳ අධිකාරි වෙනුවෙන් දරුණු අන්දමින් අය බදු ගනු ලැබී ය. කොළඹ කොටු බැම්වල පෘතුගීසි කොඩිය වෙනුවට ලන්දේසි කොඩිය මාරු කෙරිණි. එහෙත් ලන්දේසීහු පෘතුගීසීන් තරම් දරුණු කෲරයෝ නො වූහ. ඔවුහු බෞද්ධයන් ක්‍රිස්තියානීන් කිරීම සඳහා වඩා සියුම් උපක්‍රම යෙදූ හ. බවුතීස්ම නොකරන ලද ළමයින් සුජාතක ළමයින් ලෙස පිළිගැනීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ. එම නිසා, තම මුතුන් මිත්තන්ට අයිති ව තිබූ ඉඩ කඩම් ලන්දේසි රජයට අයත් වීම වළකා ගන්නට දහස් ගණන් බෞද්ධ දෙ මව්පියෝ තම දරුවන් බවුතීස්ම කළහ.

1796 දී බ්‍රිතාන්‍යයෝ අවුත් ලන්දේසීන් නෙරපා දැමූහ. පෘතුගීසිනුත් ලන්දේසිනුත් අයිති කර ගෙන සිටියේ මුහුදු

බඩ පළාත් පමණි. කඳු වළල්ලෙන් වට කරනු ලැබූ රටේ අභ්‍යන්තරය ඔවුන්ට අල්ලා ගත නොහැකි ව තිබිණ. එහෙත් බ්‍රිතාන්‍යයෝ මුහුදු බඩ පළාත්වලින් පමණක් සෑහීමට පත් නො වූ හ. ඔවුන්ට මුළු දිවයින ම යටත් කර ගැනීමට වුව මනා වී ය. ගිල්ෆඩ්හි අර්ල් තනතුරට පසු කාලයේ දී පත් වූ ෆ්‍රෙඩ්රික් නෝත් පළමු වන බ්‍රිතාන්‍ය ආණ්ඩු කාරයා වූයේ ය. ඔහු ලංකාවට පැමිණි සැටියේ ම, අවුරුදු දහ අටක ළමයකු වූ සිංහල රජු ගේ අගමැති සමඟ කුමන්ත්‍රණ ගණනාවක් පටන් ගත්තේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේ දී රට බ්‍රිතාන්‍යයන්ට යටත් වී ය. රජ පහ කර දමනු ලැබී ය. ඔහුත් සමඟ ම ලංකාවේ රජ කළ දීර්ඝ රාජාවලිය අවසාන වී ගියේ ය. සිංහලයෝ ස්වාධීනත්වය නැති වී යෑම අරගලයක් නො කොට භාර නො ගත්තෝ ය. 1815 දී මහනුවර ප්‍රෞඪ අධිපතීහූ කැරලි ගැසූහ. මේ යුද්ධය අවුරුදු දෙකක් පැවතුණේ ය. ගම් නියම් ගම් හා හරකා බාන විනාශ කර දමන ලදී. දුර්භික්ෂයත් උණ රෝගයත් රට විලෝපනය කළේ ය. සිංහල ජාතියේ පුෂ්පය එක්කෝ මරා දමනු ලැබී ය; නැති නම් පිටුවහල් කර දමනු ලැබී ය. අවසානයේ දී අප ගේ ජනතාව නොවැළැක්විය හැකි වූ දෙයට හිස නැමූහ.

කෙ තරම් හිතකර වුව ද, විදේශීය ආධිපත්‍යයක අප භ්‍රාන්තයට පත් කරන සුලු දෙයක් ඇත. දැන් ලංකාවේ අත් කම් අමතක කර දමා ඇත. ජනතාව ගේ නිර්මාණාත්මක ශක්තිය විනාශ වී ගොස් ය. උදාහරණයක් වශයෙන්, පේෂ කර්මය ගන්න. සිරුර මනා ව වැසිය යුතු ය, කාල ගුණයෙන් හා පරපුටු සතුන් ගෙන් එය ආරක්ෂා කර

ගත යුතු ය යන බෞද්ධ නියමයන් නිසා පේෂ කර්මයට ලංකාවේ මහත් තැනක් ලැබී තිබිණ. ඉන්දියානු සහ සිංහල බෞද්ධයන් අතර පැරණි කාලයේ සිට පැවත එන්නා වූ "කඨින" යන නමින් හඳුන්වනු ලබන එක්තරා උත්සවයක් තිබේ. භික්ෂූන් වහන්සේලාට කසා වත් පිළිග ැන්විය යුතු අවුරුද්දේ එක්තරා දිනක, අරුණෝදයේ දී ම කපු නෙළා, නූල් ගොතා, රෙද්ද වියා, පඬු පොවා, සවස් වන විට මැසීම ද සම්පූර්ණ කරනු ලැබේ. මේ පැරණි චාරිත්‍රය කළ හැකි තරමට දක්ෂ අය අද ලංකාවේ සිටිත් නම්, ඒ ඉතා ස්වල්ප දෙනෙකි. මා ලංකාවට පැමිණියේ, මේ කර්මාන්තය පණ ගැන්වීමේත් ධර්ම දේශනා කිරීමේ අලුත් ක්‍රමයක් ඇති කිරීමේත් අදහස ඇති ව ය. කෙසේ හෝ වේ වා, මේ අදහස ගෞතමයන් වහන්සේ ගේ අදහස්වලට අනුකූල ය. විමුක්තිය ලබා ගත හැක්කේ ආත්ම විග්‍රහයෙන් හා යහපත් ක්‍රියාවලින් විනා ධර්ම දේශනා කිරීමෙන් වත් අන්ධ වැඳුම් පිදුම්වලින් වත් නොවන බව උන් වහන්සේ විශ්වාස කළහ. බෞද්ධාගම, දැන් පවත්නා අදහසට විරුද්ධ වන, අක්‍රිය ආගමක් නො වේ. එහි මුළු දර්ශනය ම ගොඩ නැගී ඇත්තේ ක්‍රියාකාරීත්වය මත ය.

මම ජපානයේ දී පේෂ කර්ම පාඨශාලා හා කාර්මික ශාලා පාඨශාලා නැරඹීමට ගියෙමි. ජපන් ජාතිකයන් සිය පාඨශාලා පාලනය කරන අන්දම දුටු මම මවිත වීමි. මගේ ඉල්ලීම පරිදි, පේෂ කර්මය ඉගෙන ගැනීම සඳහා සිංහල ළමයින් ජපානයට යැවීම පිණිස මගේ පියා පවුම් 2,000 ක ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවී ය. බ්‍රිතාන්‍යයන් ගේ ලංකා ආක්‍රමණයෙන් පසු, පළමු වන පේෂ කර්ම පාඨශාලාව මම

1906 දී පිහිටුවූවෙමි. මෙයිනුත් දැනට දිවයින පුරා පිහිටා ඇති මෙ වැනි වෙනත් පාඨශාලා මඟිනුත්, ලංකාවේ සැම විට ම බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා සුදු රෙදි වියනු ලැබේ. ආදි කාලවල දී සම්භාවනීය අය විසින් පාවිච්චි කරනු ලබන පුටු සැම විට ම සුදු රෙදිවලින් ආවරණය කර තැබීම සිරිත වී ය. විශේෂ චාරිත්‍ර හා උත්සවවල දී මහා මාර්ගවල පවා සුදු රෙදි අතුරන ලදී.

මම තවත් ශිෂ්‍යයෙකු ගිනි කූරු නිපදවීම ඉගෙන ගැනීම සඳහා ජපානයට යැවීමි. මම මගේ සිංහල බෞද්ධයා ප්‍රවෘත්ති පත්‍රයේ මාර්ගයෙන් ඔහු වෙනුවෙන් අරමුදලක් එකතු කළෙමි. ඔහු, අමෙරිකානුන් කියන්නා සේ "පොළෝ මට්ටමේ සිට" එම ව්‍යාපාරය ඉගෙන ගනිමින් අවුරුදු තුනක් ජපානයේ වැඩ කළේ ය. ඔහු ලංකාවට පැමිණි සැටියේ ම, ස්වදේශීය පරිහරණය සඳහා ගිනිපෙට්ටි කර්මාන්තය ආරම්භ කළ සිංහල සමාගමක් විසින් සේවයට බඳවා ගනු ලැබී ය. ඉක්බිති ව ස්වීඩන් සමාගමක් ඒ කර්මාන්තය සඳහා ම අවුත් අර මුල් සමාගමෙන් කොටස් මිලයට ගැනීමට ඉදිරිපත් වී ය. දැන් ඒ කර්මාන්ත ශාලාව මුළු මනින් ම පවතින්නේ ස්වීඩන් පාලනය යටතේ ය. ස්වදේශිකයන් ගෙන යන කර්මාන්තවලට ලංකාවේ ආරක්ෂාවක් නැත. ලාබ යුරෝපීය බඩු සමඟ තරග කිරීමේ දී, සිංහලයාට කැටයම් කළ පිහි මිටවල් පිළිබඳ කර්මාන්තය ද ලෝහ ඇත් දළ කර්මාන්තය ද නතර කිරීමට සිදු වී ය. ලැන්කැස්ටරයේත් මැන්චෙස්ටරයේත් වෙනත් විවිධ යුරෝපීය නගරවලත් කර්මාන්ත ශාලා මඟින් පිට කරන්නා වූ භාණ්ඩ මහා සම්භාරය සමඟ තරග කිරීමට රට දුප්පත් වැඩි ය.

ඒ කෙසේ වුව ද, ලංකාවේ කාර්මික කලාව නඟා සිටුවීම සඳහා ආරම්භයක් ගෙන ඇත්තේ ය. බෞද්ධ අධ්‍යාපනික හා සමාජ කටයුතු බලාපොරොත්තු වූවාට වඩා සාර්ථක වී ඇත. දැන් නිදහස් බෞද්ධ පාඨශාලා ද පේෂ කර්මාන්ත ශාලා ද නිදහස් ආරෝග්‍ය ශාලාවක් ද රෝගීන්ට නොමිලයේ බෙහෙත් දෙන කොළඹ දිස්පැන්සරියක් ද ඉංග්‍රීසි , ස්වභාෂා, පාලි හා වෙනත් විෂයයන් උගන්වන බෞද්ධ විදුහල් ද ඇත්තේ ය. හින්දූහු ද ක්‍රිස්තියානීහු ද මහමදගමිකයෝ ද රජය ද බෞද්ධයෝ මහා රාශියක් ද මුලින් මෙයට විරුද්ධ වූහ. එහෙත් සිංහල බෞද්ධයා පුවත් පත මඟින් මෙය කර ගෙන යෑමට මහ ජන මතයක් ගොඩ නඟා ගැනීමට හැකි වී ය. පෙර දිග ලෝකයට සෞඛ්‍යය, වෛද්‍ය විද්‍යාව, කාර්මික හා සෞන්දර්ය කලා ආදිය අවශ්‍ය ය. විද්‍යා ප්‍රගතියේ ප්‍රතිඵල වන මේවා අවුරුදු පණහක කාලයක් මුළුල්ලේ බටහිර පැවතුණේ ය. මුදල් වියදම් කළ යුත්තේ බයිබලයේ මිත්‍යාවන් ඉගැන්වීමට නො ව,මිනිසා ගේ සුව සෙත වර්ධනය කරනු සඳහා ය.

ඇත්ත වශයෙන් ම ක්‍රිස්තියානියේ - විශේෂයෙන් ම පෙර දිග මිෂනාරි ව්‍යාපාරයෙන් පෙනෙන ක්‍රිස්තියානියේ - මට පිළිගැනීමට නොහැකි බොහෝ දේවල් තිබේ - මට එකඟ වීමට බැරි බොහෝ අංග තිබේ. ක්‍රිස්තියානීන් පරණ තෙස්තමේන්තුව ඉවත් කිරීමෙන් ද යේසුස් ඉක්මනින් කෝපයට පත් වන අසහනකාරි පුද්ගලයකු බව පෙන්වන අලුත් තෙස්තමේන්තුවේ කොටස් ඉවත් කිරීමෙන් ද ක්‍රිස්තියානිය සංශෝධනය කළ යුතු ය. එහෙත් කන්ද උඩ දේශනාව ඇත්ත වශයෙන් ම සුන්දර ය; ආධ්‍යාත්මික

පරමාදර්ශය අතින් උදුර ය. එය බෞද්ධ ආචාර ධර්මවලට අනුකූලය. පූර්ණ ආචාර ධර්ම පද්ධතියක් අඩංගු සූත්‍ර නිපාතයට සහ අංගුත්තර නිකායට එය එකඟ ය. බෞද්ධ ආචාර ධර්මත් කන්ද උඩ දේශනාවේ අඩංගු ක්‍රිස්තියානි ආචාර ධර්මත් අතර පවත්නා දැඩි සමාන කමට හේතුව බෞද්ධ ධර්ම විය යුතු ය. ඉන්දියාවේ මහා බෞද්ධ අධිරාජයා ග්‍රීක රජවරුන් පස් දෙනෙකුන් සමඟ සමාදානය වී, සිරියාවට බෞද්ධ ධර්ම දූතයන් යැවූ බව එක් අශෝක ලිපියක සඳහන් වෙයි. මහා ඇලෙක්සැණ්ඩර් රජු ගේ මරණයට නොබෝ කලකට පසු ව, බෞද්ධ ධර්ම දූතයන් වහන්සේලා මිසරයට හා පලස්තීනයට ගියහ. ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමට ප්‍රථමයෙන් බෞද්ධ අදහස් හා ධර්මය මධ්‍යධරණී ලෝකයෙහි ඉතා ප්‍රකට ව පැවති බවට සැකයක් නැත. ඒ ඇතැම් බෞද්ධ අදහස් පලස්තීනයට ද ඇතුළු වන්නට ඇත. ඒ කෙ සේ වුව ද, මා විශ්වාස කරන අන්දමට, කන්ද උඩ දේශනාව, විශ්ව ආගමක් සඳහා ආචාර විද්‍යාත්මක පදනමක් සපයයි. බෞද්ධ දෘෂ්ටි කෝණය අනු ව විරුද්ධ විය හැකි කිසි ම දෙයක් - පූජක උපක්‍රම, භෞතික වාදය හෝ බැටළු දේව ධර්ම විද්‍යාව වැනි කිසි ම දෙයක් - එහි අඩංගු නො වේ.

ආශිර්වාද ලද්දවුන් ගේ ප්‍රකාශ, බෞද්ධ ආර්ය අෂ්ටාංගික මාර්ගය සමඟ - සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන ආර්ය අෂ්ටාංගික මාර්ගය සමඟ ඉතා හොඳින් ගැළපෙයි. භාග්‍යවතුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට වදාළා වූ වචනවලින් මෙ සේ යඃ "ඔබ ඔබේ ම පහන වන්න; ඔබේ ම සරණ වන්න;

අනුන් වෙනුවෙන් ගැති නොවන්න; සත්‍යයේ ම සරණ සොයන්න; ඔබ හැර ඔබේ සරණට අන් කෙනෙකුන් වෙත නොයන්න; මගේ පරිනිර්වාණයෙන් පසු ව, තමාට ම පහන වන්නා වූ, තමාට ම සරණ වන්නා වූ, තමාගේ ශක්තිය මත ම විශ්වාසය තබන්නා වූ, සත්‍යය මත ම විශ්වාසය තබන්නා වූ, මෝක්ෂය සඳහා තමා ගැන ම විනා අනුන් ගැන විශ්වාසය නොතබන්නා වූ, මගේ ශ්‍රාවකයෝ පරම සුවය ලබන්නෝ ය.”

**නිමි**

## බෙල්ලන මහ නා හිමි සඳුනි

පුල් වනයෙක දුල් මාහැඟි කුසුමෙකි හැමුවේ ඉන් මහ
සුවඳෙක් මැ යි
පිල් නො ම ගෙන සඳ සතර එකලු කළ දුලබ ව දැකියැකි
දසුනෙක් මැ යි
සිල් ගුණ තෙද පිරි මහ පඬි රුවනෙකි සුපසන් ගුණයෙන්
දැමුණෙක් මැ යි
බෙල්ලන මහනා හිමියන් වියොවින් සසුනට වැදුණේ
විපතෙක් මැ යි

**– අනඳ**



# වසන්තයේ මල් කැකුළ ඔබ

**සසුන් රුවන්**

හිරු කුමරා උදසනින් එළිය බෙදන විට,
පුංචි මල් කැකුළු විකසිත වෙනවා
විකසිත වුණු ඒ කුසුම්වලින් සුවඳ හමන කොට
දැනෙනා සතුට කෙතරම් ද
හිරු රැස් නිසාවෙන් ම යි මෙතරම් සොඳුරු බවක්
පරිසරයට ලැබුණේ............

අවර දිගින් හිරු බැස යන විට,
සෞම්‍ය සඳ කුමරිය ලොව එළිය කරනවා
කුමුදු විලේ හරි අපූරුවට
පුංචි කුමුදු කැකුළු විකසිත වෙනවා
සිතට දැනෙන ඒ සොඳුරු මිහිර කෙතරම් අපූරු ද...........

පුංචි දියණියනි, පුංචි පුතණුවනි,
අපට ඔබ;
පිපෙන්නට වැර දරන මල් කැකුළකි
මල් කැකුළ;
අද සුවඳ නොමැති වුවත්,
හෙට දින සුවඳ දී විකසිත වෙනවා ම යි

පිය හිරු කිරණත් මවු සඳ කිරණත්
සුමුදු සුපහස නිරතුරු ලැබ
නොමියෙන පියුමක් විලසින්
පිපෙන්න; ඔබ මෙලොවේ
වඩා වටිනා ම කුසුම වී............



# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ගේ ජාතික මෙහෙවර

**කිරිබත්ගොඩ ඩී. ඒ රාජපක්ෂ විද්‍යාලයේ**
**නිපුනි සෙව්වන්දි සිසුවිය විසිනි.**

ජාතික චින්තනය හා අනන්‍යතාව ඔප් නංවමින් දේශ වාත්සල්‍යය හා ආගමික හැඟීම් පුබුදුවමින් විවිධ සත් කාර්යයන් ක්‍රියාත්මක කරමින් සමාජයේ නවෝදයක් ඇති කිරීමට දිවා රෑ වෙහෙස දරා දේශ හා දේශාන්තර කීර්තියට පාත්‍ර වූ අනගාරික ධර්මපාලතුමා පිළිබඳ තොරතුරු මෙසේ ඉදිරිපත් කළ හැක.

"වරද දුටු තැන පෙන්වාදීම මගේ ගතිය යි. මා කරන අවවාද පිළිගැනීමට අසතුටු නම් ඒ බව දත් වූ විට ලංකාව අත්හැර වෙන රටකට ගොස් විසීමට මට පුළුවන."

"මිනිසුන් විඳින දුක් හිරිහැර ගැන හිතුවාම මට උහුලන්ට බැරි තරම් සිත් වේදනාවක් ඇති විය. දුප්පත් අයට හැකි උපකාරයක් කරන්නට මම නිතර සූදනමින් සිටිමි."

අභීත වාග් විලාසයෙන් ලක් දෙරණ අවදි කළ අනගාරික ධර්මපාලතුමා ගේ අගනා ප්‍රකාශයකි මේ. එමගින් මානව වර්ගයා පිළිබඳ ව එතුමා දැක් වූ ධනාත්මක ආකල්ප මැනැවින් පිළිබිඹු වේ. තමන් උපන් දේශයට පමණක් සීමා නොවී අපමණ දුක් ගැහැට විඳිමින් දේශ දේශාන්තරයන්හි

සංචාරය කොට බුදු දහම මෙන් ම යහපත් ගුණ ධර්ම පිළිබඳ ව ද එතුමා තම නිවහල් අදහස් ප්‍රකාශ කළේ ය. අප රටේ ජාතික නායකයෙකු වශයෙන් මෙතුමා කළ සේවය අමිල ය.

අදීන නායකත්වය නොමැතිකම නිසා ශ්‍රී ලංකා ඉතිහාසයේ අඳුරු යුගයක් වූ 19 වන සියවසේ බෞද්ධ කටයුතු සියල්ල අවුල් වියවුල් සහගත තත්ත්වයක පැවැතිණි. නොයෙක් ජාතික ආගමික මතභේද නිසා දේශීය ජනතාව භේදභින්න වී සිටියෝ ය. සිංහලයෝ ස්වකීය ජන්මභූමියෙහි ම විදේශික ජනතාවක් බවට පත් ව සිටිය හ. මේ වන විට තම ජනතාව ගේ ශෝකජනක තත්ත්වය පාලක පක්ෂයට ඉදිරිපත් කිරීමට එඩිතර සිතක් ඇති අයෙක් නො වූහ. රටත්, ජාතියත්, ආගමත් පිරිහෙන හැටි හද පිරුණු ශෝකයෙන්, නෙත පිරුණු කඳුළෙන් යුතු ව මෙතුමා ඉවසිලිමත් ව බලා සිටියේ බොදු ජනයා පිබිදවීමට සුදුසු අවස්ථාවක් එළඹෙන තෙක් ය. අන්‍යයන්ගේ යහපත පිණිස තම දිවිය කැප කිරීම සඳහා එතුමා සිය දෙගුරුන් ගේ අවසර ඉල්ලා සිටියේ මෙසේ ය.

"දයාබර පියාණන් සහ මෑණියන් වෙතට යි,

එක පුද්ගලයකුගේ නොව, සියලු ලෝක සත්වයා ගේ සැප ප්‍රාර්ථනා කරන මට ඔවුන්ගේ දියුණුවට වැඩ කිරීමට ඉඩ දෙනු මැනවි. ලෞකික සැපයත් ඕනෑ නො කරන නිසාත්, බලාපොරොත්තු නොවන නිසාත් මට යමක් ඕනෑ නොකරයි. ම විසින් දෙහොත් මුදුන් දී ඉල්ලන ඉල්ලීමට බාධා නො පමුණුවා චිත්තප්‍රීතියෙන් එය මට දෙන හැටියට මම ඉල්ලමි.

ඒ මෙය යි. සම්පූර්ණයෙන් මගේ කාලය බුද්ධාගමේ දියුණුව පිණිස වැඩ  කරන්නට යි. මගේ ජීවිකාව ආරක්ෂා

කර ගැනුමට මසකට රුපියල් 5 ක් ලැබෙන්නටත් ඉල්ලමි. මේ ඉල්ලීම් ඉෂ්ට කරනු ලැබේවා!

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් අප බෝධිසත්ත්වයන් වහන්සේ ලෝක සත්ත්වයන් උදෙසා දුක් වින්ද නම් පුළුවන් පමණක් ලෝක සත්ත්වයාගේ දියුණුවට වැඩ කරන්නට අපට නොහැකි ද?

මීට,
යටහත් පුත්‍ර, ඩේවිඩ්."

අනගාරික ධර්මපාලතුමා විසින් දෙමාපියන්ට ලියන ලද ලිපියට අනුව ඔහුගේ ඉල්ලීම ඉටු වුණේ ය. මෙතැන් සිට ලෝක සත්ත්වයාගේ දියුණුව උදෙසා මෙතුමාගේ ජීවිතය කැප වුණේ ය.

1890 වර්ෂයේ දී දඹදිව සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ගිය මෙතුමා බුද්ධගයා ශුද්ධ භූමිය ශිව භක්තික මහන්තා කෙනෙකු භාරයේ පවතින සැටිත්, එහි හින්දු දෙවොලක මෙන් වතාවත් පැවැත්වෙන සැටිත් දැක කම්පාවට පත් විය. කෙසේ හෝ සමස්ත ලෝක බෞද්ධ ජනතාව සඳහා එය බේරාගැනීමට අදිටන් කළ මෙතුමා "සිංහලයිනි නැගිටිව්. බුද්ධ ගයාව බේරා ගනිව්." යන හඬ මුළු ලක්දිව පුරා පතුරුවා හරිමින් ජාතිය පණගැන්වීය. වර්ෂ 1891 මැයි මස 31 වන දින බුද්ධගයාවේ මහාබෝධි සමාගම පිහිටුවීමෙන් හේ දිගු ශාසනික මෙහෙවරක යෙදීමේ මූලික පියවර තැබුවේ ය. සිය අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ක්‍රියා කළ එතුමාගේ අධිෂ්ඨානය සඵල වී බුද්ධගයාව බෞද්ධයන්ට උරුම විය.

වර්ෂ 1893 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් චිකාගෝ නුවර පැවති ජගත් දෘෂ්ටි

සම්මේලනයට සහභාගී වූ මෙතුමා, ථේරවාදී බුදුසමයේ දක්ෂිණාංශයේ නියෝජිතයා වශයෙන් පෙනී සිට "බුදුරජාණන් වහන්සේට ලොව ණයගැති වෙයි." මැයෙන් කළ චතුර දේශනය රටට අන්තර්ජාතික කීර්තියක් අත්කර දීමෙහි ලා සමත් විය. "දෘෂ්ටි සංගම් ඉතිහාසය" නමැති පොතේ ඒ බව මැනවින් සඳහන් වේ. ධර්මපාලතුමා ගේ එම කතාව පිළිබඳ ව ඇමරිකාවේ පුවත් පත්වලින් කෙතරම් ප්‍රසිද්ධියක් ලැබුණේ ද යන්න ආපසු සිය රටට යන ගමනේ දී හොනලුලු වරායට එන විට මේ කීර්තිමත් ධර්මදූතයා දැක ගැනීම සඳහා විශාල ජනකායක් රැස් ව සිටීමෙන් පැහැදිලි වේ. එහි දී කෝටිපති, දානපතිනියක වූ මේරි පෝස්ටර් මහාත්මාව හඳුනාගැනීමට මෙතුමාට අවස්ථාව උදා විය. පසු කලෙක ධර්මපාලතුමා විසින් මෙරට හා ඉන්දියාවේ ආරම්භ කරන ලද ජාතික, ආගමික සේවා සඳහාත් බුද්ධගයාව බේරා ගැනීමේ සටන සඳහාත් ඕ නොමසුරු ව ධනය පරිත්‍යාග කළා ය.

ක්‍රි. ව 1908 දී බ්‍රිතාන්‍යයේ චාරිකාවක යෙදුණු ධර්මපාලතුමා බුදු දහම පිළිබඳ අවබෝධයක් ලබාදීමට දේශන රැසක් පැවැත්විය. දෙස්තර හේවාවිතාරණ මහතා ලන්ඩන් නුවරට යැවූ ධර්මපාලතුමා එහි මහාබෝධි සංගමයේ ශාඛාවක් විවෘත කිරීමට උපදෙස් දුන්නේ ය. ලන්ඩන් හි ග්ලෝස්ටර් මාවතේ තෙමහල් මන්දිරයක් මිලදී ගැනීමට සැලැස් වූ මෙතුමා ලන්ඩනයේ ධර්ම ප්‍රචාරය පිණිස ශ්‍රී ලාංකික ස්වාමීන් වහන්සේලා පිටත් කර යැවී ය. මෙසේ ලන්ඩන් බෞද්ධ විහාරය හා මහාබෝධි සමාගම ද පිහිටුවී ය.

විදේශ භාෂා පිළිබඳ මනා දැනීමක් නොමැති ව ධර්ම ප්‍රචාරක කටයුතු සාර්ථක කර ගැනීම කළ නොහැකි

බව ප්‍රත්‍යක්ෂ කොට ගත් ධර්මපාල තුමා එම ගැටලුව විසඳා ගැනීමට පියවර ගත්තේ ය. ඒ අනුව සෙංකඩගල පුරවරයෙන් මන්දිරයක් ලබා ගත් එතුමා එහි සාමණේර විද්‍යාලයක් ආරම්භ කර උන්වහන්සේලාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට කටයුතු කළේ ය. එහි පාලනය මහාබෝධි සමාගමට භාර කළේ ය.

වර්ෂ 1873 දී පැවති පාණදුරාවාදය හේතුකොට ගෙන බෞද්ධ ඉගැන්වීම ලොව පුරා ප්‍රචලිත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා හා ධනවත් සමාජ සේවිකාවක වූ බ්ලැවට්ස්කි මහාත්මාව විද්‍යෝදය පිරිවෙනේ දී හමුවීම මෙතුමාගේ ජීවනයට නව ආලෝකයක් ගෙන දීමට සමත් විය. රට පුරා සංචාරය කරමින් ඕල්කට් තුමා ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වූ කතා මෙතුමා සිංහලයට නැගුයේ වැටී ගිය ජාතිකත්වය, මැකී ගිය ආගමික හැඟීම්, නැසී ගිය දේශප්‍රේමය යළි පණ ගන්වමිනි. එම නිසා මීට පෙර බෞද්ධයන් යැයි ප්‍රසිද්ධියේ කීමට ලැජ්ජා වූ සිංහලයෝ ආත්ම ශක්තිය ප්‍රකෘතිමත් කොට නැඟී සිටියහ. ඕල්කට්තුමා විසින් "සත්‍යයට වඩා උසස් ආගමක් නැත" යන්න පදනම් කරගෙන සමස්ත ලෝක සහෝදරත්වය ගොඩනැඟීමේ අදිටනින් පරම විඥනාර්ථ බෞද්ධ සමාගම ආරම්භ කරන ලදී. එහි කොළඹ ශාඛාව මඟින් බෞද්ධ දරුවන් උදෙසා පාසල් ආරම්භ කිරීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේ මෙතුමා ය. කොළඹ ආනන්ද විද්‍යාලය එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇරඹි එක් පාසලකි. ඒ සමාගම වෙනත් පළාත්වල ද ඉංග්‍රීසි බෞද්ධ පාඨශාලා බිහි කරවීය. පළමුවන ඉංග්‍රීසි බෞද්ධ බාලිකා පාසල ද මේ අවදියේ ආරම්භ විය. මෙසේ සමාජ කාර්යයන්හි නිරත ව සිටිය දී

රජයෙන් පිරිනැමුණු ලිපිකාර තනතුර මෙතුමා ප්‍රතික්ෂේප කළේ "මම අධිරාජ්‍යයේ ගැත්තෙක් නොවෙමි" යි පවසමිනි.

වර්ෂ 1889 දී ඕල්කට්තුමා සමඟ ජපානයට ධර්ම දූත ගමනක යෙදීමේ භාග්‍යය අනගාරික ධර්මපාලතුමාට හිමි විය. එම ගමනේ දී ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය පළමුවරට ජපානයේ ලෙළ දුනි.

ඉන්දියාවේ පැවැත්වූ ආගමික සමුළුවකට සහභාගී වීමේ අවස්ථාව යළි උදාවීම මෙතුමන් ගේ ජීවිතයේ විශාල පරිවර්තනයක් ඇති කිරීමට හේතුපාදක විය. එතුමා එතෙක් භාවිත කළ "දොන් ඩේවිඩ්" යන නම වෙනුවට "ධර්මපාල" යන නම භාවිතයට ගත්තේ ය. එමෙන් ම බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමට සිතා ගත් එතුමා අනගාරික ධර්මපාල නමින් ප්‍රසිද්ධියට පත් විය. මෙතුමාගේ මෙම ආදර්ශය හේතු කොට ගෙන විදේශ නම් වෙනුවට සිංහල නම් භාවිතයට සමහරෙක් යොමු වූහ. දේශීය පැරණි සිරිත් විරිත්වලට ගරු කිරීමට සිංහල ජනතාව පිබිදවූයේ ද අනගාරික ධර්මපාලතුමා ය. එතුමා යුරෝපීය ඇඳුම් අතහැර අන්‍යයන්ට පූර්වාදර්ශයක් වී දේශීය ඇඳුමට ජනතාව යොමු කළේ ය. තම මවට ඔසරිය අන්දවා, සාය බොස්තොරොක්ක වෙනුවට ඔසරිය ඇඳීමට සිංහල කාන්තාවන් යොමු කළේ ය.

සත්ත්ව ඝාතනය හා මත් පැන් පානය අතිශයින් පිළිකුල් කළ මෙතුමා දේශන මඟින් ද ලිපි ලේඛන මඟින් ද ඒවායින් වැළකීමට උපදෙස් දුන්නේ ය. සිංහල බෞද්ධ උරුමය හා අයිතිවාසිකම් රැක ගැනීමට පෙරමුණ ගැනීම නිසා ජනතාව සංවිධානය කොට ඔවුන්ට කරුණු අවබෝධ කරලීමට එතුමා ගම් දනව් පුරා සැරිසැරුවේ ය. එලෙස ගමන් කිරීම සඳහා සකස් කළ "සෝබන මාලිගාව" නමින් හැඳින්වුණු

රථයෙහි නැගී දිවයිනේ විවිධ ප්‍රදේශවල සංචාරය කළ එතුමා නිද්‍රෝපගත ව සිටි සිංහල බෞද්ධයන් දේශීය චාරිත්‍රවලට අනුව හැඩගස්වන්නට මහත් වෙහෙසක් දැරී ය. ධර්මපාලතුමා ගෙන ගිය මෙම කාලෝචිත වූ සමාජ සංශෝධන ව්‍යාපාරය නො වන්නට අද අපට යැ යි කිව හැකි සිංහල බෞද්ධ හැදියාවක් දක්නට නො ලැබෙනු ඇත.

ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසළ දැනුමක් ලබා සිටි ධර්මපාලතුමා පුද්ගල අභිවෘද්ධිය ඇති කර ගැනීම පිණිස බුදු දහමේ පිටිවහල ලබාගත හැකි ආකාරය සූත්‍ර පාඨ උපුටා දක්වමින් සිංහලයන්ට පෙන්වා දුන්නේ ය. සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනගා ගැනීම සඳහා බුද්ධ දේශනාව නො දැනීම සිංහලයන්ගේ කුසීත හා අඥනකමට හේතුව වශයෙන් එතුමා ප්‍රකාශ කළේ ය. බටහිර ශිෂ්ටාචාරය මඟින් ලක්දිවට ගෙන එන ලද අධ්‍යාපනය, විද්‍යාව, තාක්ෂණය වැනි ප්‍රයෝජනවත් දෑ තබාගෙන “බටහිර දුරාචාරය” පමණක් ඉවත් කර දැමිය යුතු බවත් ධර්මපාලතුමාගේ විශ්වාසය විය.

ලංකාවේ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට නම් යුරෝපීය පාලන සමයේ දී විනාශ වෙමින් පැවති දේශීය කර්මාන්ත පුනරුත්ථාපනය කළ යුතු බව ධර්මපාලතුමා ප්‍රත්‍යක්ෂ කොට ගත්තේ ය. මේ අනුව බ්‍රිතාන්‍යයෙන් මෙරටට ආනයනය කළ රට රෙදි වෙනුවට දේශිය රෙදි පිළි නිෂ්පාදනයට මාවත සකස් කිරීමට එතුමා පියවර ගත්තේ ය. යූ. ජී දෙලපිහිල්ල මහතා ජපන් රටට යවා අත්‍යන්ත්‍ර රෙදි විවීම පිළිබඳ පුහුණුවක් ලබා දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් හේවාවිතාරණ අත්‍යන්ත්‍ර පේෂකර්ම පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කළේ ය. ඉන් පසුව ද සිංහල තරුණයන් කිහිප දෙනකු ජපන් රටට යවා ඔවුනට රෙදි

විවීම, රෙදි සායම් කිරීම, කඩදසි මල් සෑදීම හා ගිනිකූරු සෑදීමේ කර්මාන්ත පුහුණුවට අවස්ථාව ලබා දුන්නේ ය.

රටක ආර්ථිකයේ විශේෂ ස්ථානයක් වෙළෙඳාමට හිමි වන බව ධර්මපාලතුමාගේ අදහස විය. එබැවින් පාසලේදීත්, නිවසේදීත් දරුවන්ට වෙළෙඳාම පිළිබඳ ශිල්ප ශාස්ත්‍ර ඉගැන්විය යුතු බව එතුමා පැවසී ය. එවිට තුරුණු වියේදී ම ධාර්මික ව ධනය ඉපයීමට අවශ්‍ය ඥානය ඔවුනට හිමි වන බව ද විශ්වාස කළේ ය.

බටහිර වෛද්‍ය ක්‍රමය මෙරටට හඳුන්වා දුන් ඉංග්‍රීසිහු දේශිය ආයුර්වේද ක්‍රමය විනාශ වී යන තත්ත්වයට පත් කළහ. එම නිසා දේශීය වෛද්‍ය ක්‍රමය රැකගැනීමට පෙරමුණ ගත් ධර්මපාලතුමා කොළඹ ආයුර්වේද රෝහලක් පිහිටුවා අභ්‍යන්තර හා බාහිර රෝගීන් සඳහා එහි පහසුකම් සැලැස්වී ය.

එතුමා තුරුණු වියේ දී ම මාධ්‍යයට සම්බන්ධ වූයේ " සරසවි සඳරැස" පුවත් පත හරහා ය. එකල එම පුවත්පතෙහි මාධ්‍යවේදීන් වශයෙන් ක්‍රියා කළේ කිහිපදෙනෙකු පමණි. එම නිසා ධර්මපාලතුමා සරසවි සඳරැස ලේඛකයකු වශයෙන් පමණක් නොව මුද්‍රණය කිරීම හා බෙදහැරීම සඳහා දයකත්වය ද ලබා දුන්නේ ය. මුද්‍රණය කළ පුවත්පත් නැමුවේත්, මුද්දර ගැසුවේත්, ලිපිනය ලියා සියල්ල බැඳ සියතින් ම ඔසවාගෙන ගොස් තැපැලට භාර දුන්නේත් මෙතුමා ය. මේ පුවත්පතෙහි අතිරේකයන් ලෙස " ද බුඩිස්ට්" නම් ඉංග්‍රීසි පුවත්පත ආරම්භ කළ මෙතුමා ඒ පිළිබඳ ව මෙසේ සඳහන් කරයි.

"ලංකාවේ බෞද්ධයන්ට සතිපතා ප්‍රකාශයක් ආරම්භ කිරීමට කාලය පැමිණ ඇතියි මම කල්පනා කළෙමි. මම

මගේ මිතුරන්ගෙන් රුපියල් දහය බැගින් එවන ලෙස ඉල්ලා සිටියෙමි. රුපියල් තුන්සියයක් එකතු වූ විට මදුරාසියෙන් ඉංග්‍රීසි අකුරු ගෙන්වාගෙන 'ද බුඩිස්ට්' ආරම්භ කළෙමි."

මෙය සැබෑ මාධ්‍යවේදියකුගේ පූර්වාදර්ශයක් බව කිව හැකි ය. එතුමාගේ මාධ්‍ය දිවියේ වැදගත් සන්ධිස්ථානයක් වූයේ වර්ෂ 1906 දී 'සිංහල බෞද්ධයා' පත්‍රය ආරම්භ කිරීමයි. එම පුවත්පත ආරම්භ කිරීම සඳහා එතුමා විසින් 'මහා බෝධි යන්ත්‍රාලය' පිහිටුවනු ලැබී ය. එසේ ම 'දැනගත යුතු කරුණු' නමැති ලිපි පෙළින් රට ජාතිය ගොඩනගන්නට එතුමා තුළ පැවති අභිලාෂය කදිමට පැහැදිලි වේ. ජාතිය හා ලොව අවදි කිරීමට නොනැවතී කටයුතු කළ ධර්මපාලතුමා 'මහාබෝධි පණිවිඩය' ලොව පුරා ප්‍රචලිත කිරීම කිරීම සඳහා 'මහාබෝධි සඟරාව' හා 'බ්‍රිතාන්‍ය බෞද්ධයා' යන සඟරා ලන්ඩනයේ දී ආරම්භ කළේ ය. ධර්මපාලතුමා ගෙන ගිය ධර්ම ප්‍රචාරක කටයුතු මෙරටින් ඔබ්බට ද පැතිරී ගියේ මෙකී පුළුල් සන්නිවේදන ජාලයේ සංකීර්ණභාවය හේතු කොට ගෙනයි. දක්ෂ ලේඛකයකු, දේශකයකු හා දර්ශනවාදියකු වූ ධර්මපාලතුමා යුරෝපීය රටවල දේශන පවත්වද්දී බයිබලය රැගෙන යෑමට අමතක නොකෙළේ ය. බුද්ධගයාව පිළිබඳ කතා කරන විට බයිබලයේ සමහර පාඨ ද උපුටා දක්වමින් කතා කිරීම එතුමාගේ සිරිත විය. එම නිසා මෙම දේශකයාගේ දේශන ශ්‍රාවකයන්ගේ බුද්ධිය සමඟ කළ සන්නිවේදනයක් බඳු විය.

වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වැනි දින උපත ලැබූ මෙම ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයාගේ මුල් නම වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරණ ය. දෙමාපියෝ වූවාහු දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා හා මල්ලිකා හේවාවිතාරණ

මහාත්මාව යි. මෙතුමා අධ්‍යාපනය ලැබුවේ දෙමටගොඩ බැප්ටිස්, කොළඹ ශාන්ත බෙනඩික්, කෝට්ටේ ක්‍රිස්තියානි හා ගල්කිස්ස ශාන්ත තෝමස් යන විදුහල්වලිනි.

මුළු ජීවිත කාලය ම ජාතික හා ආගමික සේවය සඳහා කැප කළ මෙම යුග පුරුෂයා වර්ෂ 1931 ඉන්දියාවට ගොස් බරණැස ඉසිපතනයේ ආරම්භ කරන ලද මූලගන්ධකුටි විහාරයේ දී " සිරි දේවමිත්ත ධම්මපාල" නමින් පැවිදි බිමට ඇතුළු විය. පැවිදි වීමෙන් දෙමසකට පසු ව උපසම්පදාව ලැබූ උන්වහන්සේ වර්ෂ 1933 අප්‍රේල් මස 29 වැනි දින "සම්බුදු සසුන පතළ කරනු පිණිස යළි යළිත් උපදිම්" යි පතමින් සිහිනුවණින් යුතු ව අවසන් හුස්ම හෙළූ හ. මෙතුමා අවංක ජන නායකයෙකි. බුදු දහම ලක්දිව හා ලෝකයේ ව්‍යාප්ත කිරීමට කටයුතු කළ ශ්‍රේෂ්ඨ ධර්මදූතයෙකි. අධිරාජ්‍යවාදීන් ඉදිරියේ නොබියව ක්‍රියා කළ නිර්භීත ලාංකිකයෙකි. ලොවට මෙසේ විශාල සේවයක් කළ අනගාරික ධර්මපාලතුමාගේ නාමය සදා අමරණීය වේ.

**(මහරගම තරුණ බෞද්ධ සමිතිය මඟින් පැවැත්වුණු ශ්‍රීමත් අනගාරික ධර්මපාල රචනා තරගයේ ප්‍රථම ස්ථානය දිනාගත් රචනාවන්ගෙන් එකකි.)**



# ගුරු-දෙගුරු බුහුමන

**හෝමාගම මහින්ද රාජපක්ෂ ජාතික විද්‍යාලයේ 8 එච් ශ්‍රේණියේ එල්. ජී. හිමංසා මධුභාෂිණී සිසුවිය විසිනි.**

රත් පැහැයෙන් යුත් ලේ බිඳු
රන් කිරි සේ මුව තවරා
දැඩි කළේ අප සෙනෙහසින්
අපට ජීවය දෙන ලෙසින්

සැනසුම් බස් දී අප සනසවමින්
නැණ ගුණ දම් නිති වැඩෙන ලෙසින්
යහ මඟට ම අප යොමු කෙරුවේ
මෑණියනි, ඒ ඔබ නොවෙදෝ?

දෑතේ රළු කරගැට නංවා
දහඩිය බිඳු බිඳු වගුරාලා
රස අහරින් අප කුස පුරවා
අපේ ලෝකයේ හිරු වූයේ
ඔබයි පියාණනි, සැමදා

වැටෙන විටදී නැඟි නැඟී සිටින්නට
බාධක මැද නොසැලී පවතින්නට
නුවණ දිදී අප පෙරට ම යැව්වේ
ඔබමයි නිරතුරු පියාණනි

සරු වූ ගුණ දම් පවසාලා
දින දින නුවණින් පොහොසත්
වන්නට
උදව් කළේ නිරතුරු අප සැම හට
ඔබමයි ගුරු ඇදුරිඳුනි අපේ

මෙලෙසින් අප ලොව ගොඩ නැංවූ
අද වියපත් වී සිටිනා ඔබ
දිවි ගෙවන්නේ කෙලෙසද මේ
නිමවුණු රැඳවුම් කුටි තුළ තනිව ම?

වාරු නොමැති දෙපාවලට
සැනසුම් නැති හදවත් වෙත
අද ජීවය කවුද පුතුනි?
ඔබ හැර නෑ අන් කිසිවෙක්

සසර දුකින් එතෙර වන්න
යහමින් පින් රැස් කරන්න
ලොවක් වඩන්නට දිරි දුන්
ගුරු දෙගුරුන් සළකන්නට
නොහැකි වුවොත් පුතුනේ,

නිවන් දකින්නට ඔබ හට
පින් මදි වී තැවෙනු ඇතේ.......!



# Sirimath Anagarika Dhammapala

By: **Ven.Tirikunamale Ananda Maha Thera.**

Translated by: **Mrs. Srima warusawithana.**

A lion's roar he sounded – to break through fetters of an alien foe
Hero who delivered our Motherland, from the shackles of rulers –
With grateful hearts we revere you - Sirimath Anagarika Dhammapala,
Whilst we march forward in unity and with courage once more.

Your lifeblood was the Sinhela Buddhist ideal
To all in our blessed Isle, you brought succuor and joy;
"Wake up, wake up from your slumber deep,"
This was the clarion call you raised, steering our proud heritage,
Father of our nation, Leader invincible.

Virtue, grit, non-violence, the watchwords that shaped your life,
Never faltering, determined with selfless sacrifice,
Amazing, marvelous the feat you performed
At Buddhagaya; still brings tears to one's eyes.

Fearless, noble and virtuous, with your loud and bellowing call,
Beckoning the farmers in the fields, the workers that toil,
So you may lead our nation to our pristine past glory,
Come hither once more to our precious soil.